සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது ]
All Rights Reserved]

7026

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ
සීමිත / විවෘත තරග විභාගය - 2014

**(01) මූල්‍ය ගණකාධිකරණය - I වන පත්‍රය**

පැ. තුනයි

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

**1.** සීමිත සිරිපුර පොදු සමාගමෙහි 2014.03.31 දිනට ශේෂ පිරික්සුම පහත දී ඇත.

| | හර (රු. '000) | බැර (රු.'000) |
|---|---|---|
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධන (කොටස් 4 000)........ | | 20 000 |
| නිදහස් කළ නොහැකි වරනීය කොටස් ප්‍රාග්ධනය (කොටස් 2 000)........ | | 10 000 |
| 2013.04.01 දිනට රඳවා ගත් ඉපැයුම් ........ | | 2 500 |
| විකුණුම් පිරිවැය / විකුණුම් ........ | 175 000 | 371 800 |
| බැංකු ණය ........ | | 20 000 |
| බෙදාහැරීමේ වියදම් ........ | 15 000 | |
| පරිපාලන වියදම් ........ | 12 000 | |
| වෙනත් වියදම් ........ | 7 500 | |
| මූල්‍ය වියදම් ........ | 2 500 | |
| ගෙවූ ආදායම් බදු - 2013/2014 ........ | 5 500 | |
| - 2012/2013 ........ | 1 600 | |
| **දේපළ, පිරියත හා උපකරණ** | | |
| ඉඩම් ........ | 150 000 | |
| ගොඩනැගිලි ........ | 12 000 | |
| මෝටර් වාහන ........ | 10 500 | |
| **2013.04.01 දිනට ක්ෂය වෙන් කිරීම** | | |
| ගොඩනැගිල්ල ........ | | 1 200 |
| මෝටර් වාහන ........ | | 1 900 |
| 2014.03.31 තොගය ........ | 2 000 | |
| වෙළඳ ණයගැතියෝ ........ | 5 000 | |
| වෙළඳ ණයහිමියෝ ........ | | 6 000 |
| 2013.04.01 ආදායම් බදු වෙන් කිරීම ........ | | 1 500 |
| බැංකුව ........ | 15 000 | |
| ලාභාංශ - අතුරු | | |
| සාමාන්‍ය කොටස් ........ | 4 000 | |
| වරනීය කොටස් ........ | 2 000 | |
| ආයෝජන ........ | 33 500 | |
| අවිනිශ්චිත ගිණුම ........ | | 18 200 |
| | **453 100** | **453 100** |

අතිරේක තොරතුරු,

(i) 2014.03.31 දිනට තොගයෙහි ශුද්ධ උපලබ්ධිත අගය රු. 1 800 000 කි.

(ii) සමාගම 2014 මාර්තු 31 දින එහි ඉඩම ප්‍රත්‍යගණනය කරන ලදී. ප්‍රත්‍යගණනය කිරීමෙන් පසු ඉඩමෙහි වටිනාකම රු. 200 000 000 කි. මෙය ගිණුම්වල සටහන් කර නැත.

[ 2 වැනි පිටුව බලන්න.

(iii) සමාගම 2009 අප්‍රේල් 01 දින රු. 1 500 000 ට මිලදී ගෙන තිබූ මෝටර් රථයක් 2014.03.31 දින රු. 800 000 ට විකුණන ලදී. ලැබුණු මුදල බැංකු ගිණුම සහ මෝටර් රථ ගිණුමෙහි සටහන් කරන ලදී. මෝටර් රථ ඉවත් කිරීම සම්බන්ධයෙන් ගිණුම් පොත්වල වෙනත් කිසිම සටහනක් තබා නැත.

(iv) සමාගම ජංගම නොවන වත්කම් පිරිවැය මත සරල මාර්ග ක්‍රමය අනුව ක්ෂය කරනු ලබන අනුපාත පහත සඳහන් පරිදි වේ.

මෝටර් රථ - වර්ෂයකට 25%

ගොඩනැගිලි - වර්ෂයකට 10%

(v) බැංකු ණය ලබා ගන්නා ලද්දේ 2014 ජනවාරි 01 දින දී ය. ණය මුදලෙහි මුල් මුදල 2014 අප්‍රේල් 01 දිනෙන් ආරම්භ කොට සමාන කාර්තුමය වාරික හතරකින් ආපසු ගෙවිය යුතුය.

(vi) ශේෂ පිරික්සුමේ පෙන්වා ඇති බැංකු ශේෂය උපුටා ගෙන ඇත්තේ 2014 මාර්තු මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමට පෙර ය. බැංකු සැසඳුම පිළියෙල කිරීමේ දී පහත සඳහන් දෑ අනාවරණය විය.

- තැන්පත් කළ එහෙත් නිශ්කාෂණය නොවූ චෙක්පත් රු. 5 000 000.
- නිකුත් කළ එහෙත් ඉදිරිපත් නොකළ චෙක්පත් රු. 3 000 000.
- ණය ගැතියකු සෘජුව බැංකුවේ තැන්පත් කළ රු. 1 000 000 ක් ව්‍යාපාරයේ පොත්වල සටහන්වී නැත.
- නිත්‍ය නියෝග මත බැංකුව ගෙවා තිබූ රක්ෂණ වාරිකය රු. 500 000 ව්‍යාපාරයේ පොත්වල සටහන්වී නැත.

(vii) වර්ෂය සඳහා ආදායම් බදු වගකීම රු. 8 500 000 කට ඇස්තමේන්තු කර ඇත.

(viii) 2014.04.20 දින සිදු වූ ගින්නක් නිසා ව්‍යාපාරයෙහි ගොඩනැගිල්ලකින් කොටසක් විනාශ වූ අතර එහි වටිනාකම රු. 200 000 පමණ වේ යැයි ඇස්තමේන්තු කර ඇත.

(ix) ගිණුම් තැබීමේ ක්‍රියාවලියේ දී පහත සඳහන් වැරදි සිදුවී ඇති බව සොයාගෙන ඇත.

- රු. 2 200 000 ක විකුණුම් ඉන්වොයිසියක් පිළිබඳව ගිණුම් තැබීම සම්පූර්ණයෙන් ම අත්හැරී ඇත.
- රු. 7 500 000 ක ප්‍රචාරණ වියදමක් එම ගිණුමට පිටපත් කර ඇත්තේ රු. 5 700 000 ක් ලෙසය.
- රු. 10 000 000 ක ලද කුලී ආදායම් බැංකු ගිණුමෙහි නිවැරදිව සටහන් කර කුලී වියදම් ගිණුමට හර කර ඇත.

(x) 2014 මැයි 30 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් තීරණවලට එළඹුණි.

- 2014 මාර්තු 31 දිනට පැවැති සාමාන්‍ය කොටස් සඳහා එක් කොටසකට වර්ෂයකට රු. 3 බැගින් වූ අවසාන ලාභාංශයක් ගෙවීම.
- 2014 මාර්තු 31 දිනට පැවැති වරනීය කොටස් සඳහා එක් කොටසකට වර්ෂයකට රු. 2 බැගින් ලාභාංශයක් ගෙවීම.

(xi) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 ජුනි 10 දින මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමත කරන ලදී.

**අවශ්‍ය වන්නේ:**

සීමාසහිත සිරිපුර පොදු සමාගම සඳහා ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකාරයෙන් පහත සඳහන් දෑ පිළියෙල කරන්න.

(1) 2014 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

(2) 2014 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

(3) 2014 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

(4) දේපළ පිරියත සහ උපකරණ සඳහා සටහන්

*(ලකුණු 40 යි)*

**2.** (i) ගිණුම්කරණ අනුපාත භාවිතයේ ප්‍රයෝජන සහ සීමා දෙකක් බැගින් සඳහන් කරන්න.

(ii) සීමිත සමාගමක ප්‍රසාද කොටස් නිකුතුව සහ හිමිකම් කොටස් නිකුතුවක් අතර ඇති මූලික සමානකමක් සහ අසමානකමක් බැගින් ලියන්න.

(iii) පරිගණක මත පදනම් වූ ගිණුම්කරණ පද්ධතියකින් ලබාගත හැකි ප්‍රතිලාභ හතරක් ලියන්න.

(iv) ගිණුම්කරණ මෘදුකාංගයක් මිල දී ගැනීමේ දී සලකා බැලිය යුතු සාධක හතරක් සඳහන් කරන්න.

(v) මූල්‍ය ප්‍රකාශනවල සීමාවන් හතරක් ලියන්න.

*(ලකුණු 10 යි)*

[ 3 වැනි පිටුව බලන්න.

**3.** සීමාසහිත අරුණෝදය සමාගමෙහි සාරාංශගත මූල්‍ය ප්‍රකාශන පහත වේ.

**සීමිත අරුණෝදය සමාගම**

**2014.03.31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය**

| | රු. '000 | රු. '000 |
|---|---|---|
| විකුණුම් | | 75 000 |
| විකුණුම් පිරිවැය | | (40 000) |
| දළ ලාභය | | 35 000 |
| වෙනත් ආදායම් (සටහන් 01) | | 10 000 |
| | | 45 000 |
| බෙදාහැරීමේ වියදම් | 10 000 | |
| පරිපාලන වියදම් | 15 000 | |
| මූල්‍ය වියදම් - ණය පොලිය | 5 000 | |
| | | (30 000) |
| බදු පෙර ලාභය | | 15 000 |
| ආදායම් බදු | | (5 250) |
| කාලපරිච්ඡේදය සඳහා ලාභය | | 9 750 |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | |
| ඉඩම් ප්‍රත්‍යගණන අතිරික්තය | | 1 000 |
| මුළු විස්තීර්ණ ආදායම | | **10 750** |

**සීමිත අරුණෝදය සමාගම**

**මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශ**

| | **2014** (රු. **'000**) | **2013** (රු. **'000**) |
|---|---|---|
| දේපළ පිරියත හා උපකරණ (සටහන් 02) | 200 000 | 213 000 |
| ආයෝජන | 57 000 | 40 000 |
| තොග | 7 000 | 12 000 |
| වෙළඳ ණය ගැතියෝ | 25 000 | 50 000 |
| ලැබිය යුතු ආයෝජන ආදායම | 5 000 | 7 000 |
| මුදල් | 63 000 | 78 000 |
| | **357 000** | **400 000** |
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 112 000 | 100 000 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 6 000 | 5 000 |
| පොදු සංචිතය | 1 750 | 3 000 |
| රඳවාගත් ඉපැයුම් | 17 000 | 8 000 |
| බැංකු ණය | 200 000 | 259 000 |
| වෙළඳ ණය හිමියෝ | 13 000 | 18 000 |
| උපචිත - ආදායම් බදු | 4 250 | 3 000 |
| - ණය පොලිය | 3 000 | 4 000 |
| | **357 000** | **400 000** |

[ 4 වැනි පිටුව බලන්න.

7026

**සීමිත අරුණෝදය සමාගම**

**2014.03.31 න් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය**

රු. '000

| විස්තර | ප්‍රකාශිත ප්‍රාග්ධනය සාමාන්‍ය කොටස් | ප්‍රත්‍යාගණන සංචිතය | පොදු සංචිත | රඳවාගත් ලාභ | එකතුව |
|---|---|---|---|---|---|
| **2013.04.01** ශේෂය | 100 000 | 5 000 | 3 000 | 8 000 | 116 000 |
| කොටස් නිකුත් කිරීම | 10 000 | – | – | – | 10 000 |
| වර්ෂයේ විස්තීර්ණ ආදායම | – | 1 000 | – | 9 750 | 10 750 |
| පොදු සංචිතය | – | – | 750 | (750) | – |
| ප්‍රසාද කොටස් නිකුත් කිරීම | 2 000 | – | (2 000) | – | – |
| **2014.03.31 දිනට ශේෂය** | **112 000** | **6 000** | **1 750** | **17 000** | **136 750** |

සටහන්

සටහන **01**

වෙනත් ආදායම්

| | (රු. '000) |
|---|---|
| මෝටර් රථ ඉවත් කිරීමේ ලාභය | 2 000 |
| ආයෝජන ආදායම් | 8 000 |
| | **10 000** |

සටහන 02

දේපළ, පිරියත සහ උපකරණ

(රු. '000)

| | ඉඩම් | ගොඩනැගිලි | මෝටර් රථ | |
|---|---|---|---|---|
| **2013.04.01** පිරිවැය | 100 000 | 60 000 | 90 000 | |
| එකතු කිරීම් | – | 10 000 | – | |
| ප්‍රත්‍යාගණනය | 1 000 | – | – | |
| ඉවත් කිරීම් | – | – | (20 000) | |
| **2014.03.31 දිනට ශේෂය** | **101 000** | **70 000** | **70 000** | |
| සමුච්චිත ක්ෂය | | | | |
| **2013.04.01** ශේෂය | – | 12 000 | 25 000 | |
| වාර්ෂික ක්ෂය | – | 3 000 | 9 000 | |
| ඉවත්කිරීම් | – | – | (8 000) | |
| **2014.03.31 දිනට ශේෂය** | – | **15 000** | **26 000** | |
| **2014.03.31 දිනට ශේෂය** | **101 000** | **55 000** | **44 000** | = **200 000** |

අවශ්‍ය වන්නේ :

සෘජු ක්‍රමය (Direct method) භාවිත කර ශ්‍රී.ල.ගි.ප්‍රමිත (LKAS) අංක 07 ට අනුව 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමාසහිත අරුණෝදය සමාගමෙහි මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කළ යුතු ය.

*(ලකුණු 20 යි)*

[ 5 වැනි පිටුව බලන්න.

**4.** 2014.03.31 න් අවසන් ශේෂය සඳහා සීමිත අමර පොදු සමාගමෙහි සහ සීමිත සාමා පොදු සමාගමෙහි සාරාංශ ගත මූල්‍ය ප්‍රකාශන පහත දී ඇත.

**2014.03.31 න් අවසන් ශේෂය සඳහා ආදායම් ප්‍රකාශ**

| | අමර සමාගම (රු. '000) | සාමා සමාගම (රු. '000) |
|---|---|---|
| විකුණුම් | 2 250 | 2 000 |
| විකුණුම් පිරිවැය | (1 450) | (1 500) |
| දළ ලාභය | 800 | 500 |
| වියදම් | (450) | (300) |
| බදුවලට පෙර ශුද්ධ ලාභය | 350 | 200 |
| ආදායම් බදු | (150) | (100) |
| කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ ලාභය | 200 | 100 |

**2014.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන**

| | අමර සමාගම (රු. '000) | සාමා සමාගම (රු. '000) |
|---|---|---|
| දේපළ, පිරියත හා උපකරණ | 800 | 1 600 |
| තොග | 100 | 200 |
| වෙළඳ ණය ගැතියෝ | 130 | 100 |
| මුදල් | 170 | 100 |
| | **1 200** | **2 000** |
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 500 | 1 000 |
| රඳවාගත් ඉපැයුම් | 360 | 400 |
| බැංකු ණය | 140 | 200 |
| වෙළඳ ණය හිමියෝ | 80 | 220 |
| උපචිත වියදම් | 120 | 180 |
| | **1 200** | **2 000** |

අමතර තොරතුරු :

- අමර සමාගමෙහි සහ සාමා සමාගමෙහි වියදම් තුළ අඩංගු ණය පොළිය රු. 100 000 බැගින් වේ.

අවශ්‍ය වන්නේ :

සමාගම් දෙක සඳහා පහත දැක්වෙන අනුපාත :

(1) දළ ලාභ අනුපාතය

(2) ශුද්ධ ලාභ අනුපාතය

(3) ජංගම අනුපාතය

(4) ක්ෂණික වත්කම් අනුපාතය

(5) පොළී ආවරණ (cover) අනුපාතය

(6) හිමිකමට ප්‍රතිලාභ අනුපාතය

(7) මුළු වත්කම්වලට ප්‍රතිලාභ අනුපාතය

*(ලකුණු 15 යි)*

[ 6 වැනි පිටුව බලන්න.

**5.** (i) චතුරංගගේ ව්‍යාපාරයෙහි 2014.03.31 දිනට ණයගැති ලෙජරයෙහි ශේෂ එකතුව (හර) රු. 75 000 ක් විය. එය එදිනට ණය ගැති පාලන ගිණුමෙහි ශේෂයට සමාන විය. 2014 අප්‍රේල් මාසයට අදාළව පහත තොරතුරු ලබා දී ඇත.

| | රු. |
|---|---|
| ණයට විකුණුම් | 125 000 |
| අත්පිට විකුණුම් | 210 000 |
| ණයගැතියන්ගෙන් ලද මුදල් | 100 000 |
| අඩමාණ ණය වෙන්කිරීම | 7 500 |
| දුන් වට්ටම් | 10 000 |
| ආපසු එවුම් | 5 000 |
| බොල් ණය | 4 000 |
| ණයගැතියන්ගෙන් අයකළ පමා පොළිය | 9 000 |

2014.04.30 දිනට ණයගැති පාලන ගිණුමෙහි ශේෂය ණයගැති ලෙජරයෙහි ශේෂ එකතුව සමග සැසඳුනේ නැත. පරීක්ෂාවේ දී පහත කරුණු හෙළිදරව් විය.

(අ) කපාහළ බොල් ණය රු. 2 000 ක් ණයගැති ලෙජරයෙහි සටහන් කර නැත.

(ආ) දුන් වට්ටම් රු. 3 000 ක් ණයගැති ලෙජරයෙහි ණයගැති ගිණුමෙහි වැරදි පැත්තෙහි සටහන් කර ඇත.

(ඉ) රු. 10 000 ක විකුණුම් ඉන්වොයිසින් ණයගැති ලෙජරයෙහි අදාළ ණයගැති ගිණුමේ සටහන් කර නැත.

අවශ්‍ය වන්නේ :

(1) 2014 අප්‍රේල් මාසය සඳහා ණයගැති පාලන ගිණුම

(2) 2014 අප්‍රේල් 30 දිනට ණයගැති පාලන ගිණුමෙහි ශේෂය ණයගැති ලෙජරයෙහි ශේෂ එකතුව සමග සැසඳීමේ ප්‍රකාශය

(ii) චතුරගේ ව්‍යාපාරයෙහි 2014 ජූලි 31 දිනට බැංකු විස්තරයට අනුව අයිරාව රු. 40 000 කි. එහෙත් එදිනට මුදල් පොතට අනුව බැංකු ශේෂය ඊට වෙනස් විය. ඒ සඳහා බලපෑ හේතූන් පහත පරිදි වේ.

(අ) තැන්පත් කළ එහෙත් නිශ්කාෂණය නොවූ චෙක්පත් හි වටිනාකම රු. 15 000 කි.

(ආ) නිකුත් කළ එහෙත් ඉදිරිපත් නොකළ චෙක්පත්හි වටිනාකම රු. 10 000 කි.

(ඉ) ගනුදෙනුකරුවකු වූ අජන්ත සෘජුව බැංකුවෙහි තැන්පත් කර ඇති රු. 12 000 ක් ව්‍යාපාරයේ මුදල් පොතෙහි සටහන් කර නැත.

(ඊ) ව්‍යාපාරයේ දුරකථන බිල සඳහා බැංකුව ගෙවූ රු. 4 000 ක් වයාපාරයෙහි මුදල් පොතෙහි සටහන් කර නැත.

(උ) ව්‍යාපාරය සිදුකළ ස්ථාවර තැන්පතුවක් වෙනුවෙන් බැංකුවට එකතු කරගෙන තිබූ වටිනාකම රු. 18 000 කි. ව්‍යාපාරයෙහි පොළී ආදායම මුදල් පොතේ සටහන් කර නැත.

(ඌ) බැංකුව අයකර තිබූ බැංකු ගාස්තු රු. 1 000 ක් මුදල් පොතෙහි සටහන් කර නැත.

අවශ්‍ය වන්නේ :

(1) 2014 ජූලි මාසය සඳහා සංශෝධිත මුදල් ගිණුම / බැංකු ගිණුම

(2) 2014 ජූලි මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය

*(ලකුණු 15 යි)*

* * *

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ සීමිත / විවෘත තරග විභාගය – 2014

පැ තුනයි

## (02) මූල්‍ය ගණකාධිකරණය - II වන පත්‍රය

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

---

**1.** (i) රොෂාන්, චතුරංග සහ සඳරුවන් RCS අසෝසියේට් හි හවුල්කරුවන් වූ අතර ඔවුන් පිළිවෙළින් 3:2:1 අනුපාතයට ලාභාලාභ බෙදා ගන්නා ලදී. හවුල් ගිවිසුමට අනුව ඔවුන්ට වාර්ෂිකව 10% ක ප්‍රාග්ධන පොලියක් හිමිවිය. තව ද, රොෂාන්ට සහ සඳරුවන්ට පිළිවෙළින් මසකට රු. 20 000 ක් සහ රු. 15 000 ක් බැගින් වැටුප් හිමිවිය.

2014.03.31 දිනට හවුල් ව්‍යාපාරයෙහි ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | රු. ('000) | රු. ('000) |
|---|---|---|
| 2013.04.01 දිනට ප්‍රාග්ධන ශේෂ | | |
| - රොෂාන් | – | 5 000 |
| - චතුරංග | – | 4 000 |
| - සඳරුවන් | – | 3 500 |
| 2013.04.01 දිනට ජංගම ගිණුම් ශේෂ | | |
| - රොෂාන් | – | 200 |
| - චතුරංග | – | 100 |
| - සඳරුවන් | 50 | – |
| 2013.04.01 දිනට තොගය - පිරිවැය | 780 | – |
| ගැණුම් | 6 600 | – |
| ඉඩම් සහ ගොඩනැගිලි - පිරිවැය | 7 500 | – |
| කාර්යාල උපකරණ - පිරිවැය | 2 500 | – |
| මෝටර් රථ - පිරිවැය | 2 700 | – |
| ආයෝජන | 500 | – |
| 2013.04.01 දිනට ක්ෂය වෙන් කිරීම් | | |
| - ගොඩනැගිලි | – | 600 |
| - කාර්යාල උපකරණ | – | 700 |
| - මෝටර් රථ | – | 850 |
| විකුණුම් | – | 15 250 |
| පොලී වියදම | 150 | – |
| කුලිය | 440 | – |
| විකුණුම් ආපසු එවුම් | 250 | – |
| දුන් වට්ටම් සහ ලද වට්ටම් | 160 | 60 |
| විකුණුම් වියදම් | 1 350 | – |
| කාර්යාල වියදම් | 3 750 | – |
| ණය ගැතියෝ සහ ණය හිමියෝ | 4 200 | 1 415 |
| බොල් සහ අඩමාන ණය | 420 | – |
| ගෙන ඒමේ කුලි | 180 | – |

[දෙවන පිටුව බලන්න.

| | | |
|---|---|---|
| කීර්ති නාමය | 500 | – |
| ණය - සඳරුවන් | – | 300 |
| ගැනිලි | | |
| - රොෂාන් | 250 | – |
| - චතුරංග | 300 | – |
| - සඳරුවන් | 175 | – |
| බැංකු අයිරාව | – | 780 |
| | 32 755 | 32 755 |

අතිරේක තොරතුරු ;

(අ) 2014.03.31 දින සඳරුවන් හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගත් අතර රොෂාන් සහ චතුරංග සමසමව ලාභාලාභ බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරය ඉදිරියට ගෙයාමට තීරණය කලහ. සඳරුවන්ට හිමි මුළු වටිනාකම ඔහුගේ ණය ගිණුමට මාරු කිරීමට තීරණය විය.

(ආ) නව හවුල් ගිවිසුමට අනුව ලාභ බෙදා හැරීම් වශයෙන් හවුල්කරුවන්ට වැටුප් හිමි නොවන අතර ප්‍රාග්ධන පොලිය වාර්ෂිකව 12% ක් වේ.

(ඉ) 2014.03.31 දිනට හවුල් ව්‍යාපාරයෙහි කීර්ති නාමය රු. 800 000 කට අගය කළ අතර හවුල් ව්‍යාපාරයෙහි පොත්වල කීර්තිනාම ගිණුමක් පවත්වාගෙන නොයාමට තීරණය විය.

(ඊ) රු. 200 000 ක් බොල් ණය ලෙස කපා හැරීමට තීරණය විය.

(උ) 2014.03.31 දිනට උපචිත කාර්යාල වියදම් රු. 55 000 ක් වූ අතර විකුණුම් වියදම්වලින් රු. 75 000 ක් 2015.03.31 න් අවසන් වර්ෂය සඳහා අදාළ වේ.

(ඌ) 2014.03.31 දිනට තොගය පිරිවැය රු. 865 000 කට අගය කළ අතර එහි ශුද්ධ උපලබ්ධිත අගය රු. 985 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී.

(එ) හවුල් ව්‍යාපාරයෙහි ඉඩම්වල පිරිවැය රු. 5 000 000 ක් වන අතර දේපල, පිරියත සහ උපකරණ සරල මාර්ග ක්‍රමයට පහත පරිදි ක්ෂය කරනු ලැබේ.

ගොඩනැගිලි - වාර්ෂික 5%

කාර්යාල උපකරණ - වාර්ෂික 20%

මෝටර් රථ - වාර්ෂික 10%

(ඒ) ශේෂ පිරික්සුමෙහි දක්වා ඇති ආයෝජන 2013.10.01 දින වාර්ෂිකව 9% ක පොලියට වසර 3 ක් සඳහා සිදුකළ ස්ථාවර තැන්පතුවක් නිරූපණය කරයි.

අවශ්‍ය වන්නේ ;

1. 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය
2. 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ/අලාභ විසර්ජන ගිණුම
3. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් සහ ජංගම ගිණුම්
4. 2014.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ශේෂ පත්‍රය)

*(ලකුණු 32 යි)*

(ii) සනත් සහ මහේල පිළිවෙළින් 2:1 අනුපාතයට ලාභාලාභ බෙදාගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලදී. 2014.03.31 දින ඔවුන් හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීමට තීරණය කළ අතර එදිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පහත දැක්වේ.

| | රු. ('000) |
|---|---|
| **ජංගම නොවන වත්කම්** | |
| දේපල, පිරියත සහ උපකරණ | 7 500 |
| ආයෝජන | 1 250 |
| **ජංගම වත්කම්** | |
| තොගය | 750 |
| වෙළඳ ණයගැතියෝ | 810 |
| මුදල් සහ බැංකු | 390 |
| | **10 700** |

[තුන්වන පිටුව බලන්න.

7018

| | |
|---|---|
| **හිමිකම** | |
| ප්‍රාග්ධන ගිණුම් | |
| - සනත් ............................................................. | 4 750 |
| - මහේල ............................................................. | 3 250 |
| ජංගම ගිණුම් | |
| - සනත් ............................................................. | 245 |
| - මහේල ............................................................. | 325 |
| **ජංගම නොවන වගකීම්** | |
| ණය ගිණුම - මහේල ............................................. | 1 500 |
| **ජංගම වගකීම්** | |
| වෙළඳ ණය හිමියෝ ............................................. | 630 |
| | **10 700** |

අතිරේක තොරතුරු ;

(අ) රු. 2 400 000 ධාරණ අගයක් සහිත මෝටර් රථයක් රු. 2 800 000 ක එකඟ වූ වටිනාකමකට සනත් විසින් පවරා ගන්නා ලදී. වෙළඳ ණය ගැතියන්ගෙන් 5% ක වට්ටමකට යටත්ව මුදල් එකතු කර ගන්නා ලදී. රු. 500 000 තොග කපාහරින ලද අතර මුදල් සහ බැංකු හැර ඉතිරි සියළු වත්කම් රු. 8 200 000 කට විකුණන ලදී.

(ආ) සියළුම වගකීම් පියවන ලදී. ණය හිමියන්ගෙන් 10% ක වට්ටමක් හිමි විය.

(ඉ) රු. 800 000 ක විසිරුවා හැරීමේ වියදමක් දරන ලදී.

අවශ්‍ය වන්නේ ;

1. උපලබ්ධි ගිණුම
2. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්
3. මුදල් සහ බැංකු ගිණුම

*(ලකුණු 08 යි)*
*(මුළු ලකුණු 40 යි)*

**2.** 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ බීටා පොදු සමාගමෙහි පහත ගනුදෙනු සිදුවී ඇත.

(i) 2013.04.01 දින මූල්‍ය කල්බදු පදනම යටතේ මෝටර් රථයක් අත්පත් කර ගන්නා ලදී. මෙදිනට මෝටර් රථයෙහි සාධාරණ අගය රු. 4 500 000 ක් විය. ගිවිසුමට එළැඹි දින රු. 1 000 000 ක මූලික ගෙවීමක් සිදු කළ අතර ඉතිරිය 2014.03.31 දින සිට ආරම්භ වී රු. 800 000 ක් බැගින් වන සමාන වාර්ෂික වාරික පහකින් ගෙවීමට එකඟ විය. පළමු සහ දෙවන වාර්ෂික කල්බදු වාරික තුළ අන්තර්ගත කල්බදු පොලිය පිළිවෙළින් රු. 420 000 ක් සහ රු. 370 000 ක් වේ. පළමු වාර්ෂික කල්බදු වාරිකය නියමිත දින ගෙවන ලදී. මෝටර් රථයෙහි ඵලදායි ජීව කාලය වසර 5 කි.

(ii) සමාගම වසරක ප්‍රතිඥාහාර යටතේ භාණ්ඩ අලෙවි කරන අතර වර්ෂය තුළ ප්‍රතිඥාහාර සහිතව කරන ලද මුළු විකුණුම්වල වටිනාකම රු. 8 000 000 කි. 2014.03.31 දිනට ප්‍රතිඥාහාරය සඳහා මුළු වෙන් කිරීම වර්ෂය තුළ සිදු කරන ලද මුළු විකුණුම්වලින් 5% ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. 2013.03.31 දිනට ප්‍රතිඥාහාරය වෙන් කිරීමේ ශේෂය රු. 350 000 ක් වූ අතර 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ සමාගම රු. 280 000 ප්‍රතිඥාහාර වියදම් මුදලින් දරන ලදී.

(iii) රු. 2 000 000 කට ඉන්වොයිස් කරන ලද භාණ්ඩ සමාගම විසින් විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත නියෝජිතයෙකුට යවා ඇත. පිරිවැයට 25% ක ලාභ අන්තියක් එකතු කර භාණ්ඩ ඉන්වොයිස් කර ඇත. 2014.03.31 දිනට මෙම භාණ්ඩවලින් 60% ක් නියෝජිතයා ළඟ නොවිකිණී ඉතිරිව තිබිණි.

(iv) 2011.04.01 දින රු. 1 500 000 කට මිලදී ගත් යන්ත්‍රයක් ඵලදායි ජීවකාලය වසර 08 ක් සහ සුන්බුන් අගය රු. 300 000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. කෙසේ වුවද, 2013.04.01 දින මෙම වත්කමේ ඵලදායි ජීව කාලය මිලදී ගත් දින සිට වසර 07 ක් සහ සුන්බුන් අගය රු. 200 000 ක් ලෙස නැවත අගය කරන ලදී.

(v) තත්ත්වයෙන් බාල අමුද්‍රව්‍ය සැපයීම නිසා 2014.03.01 දින රු. 1 000 000 ක වන්දියක් ඉල්ලමින් සමාගම විසින් සැපයුම් කරුවකුට විරුද්ධව නඩු පවරා ඇත. සමාගමේ නීතිඥවරුන්ගේ මතය වන්නේ නඩුව සමාගමට ඉතා වාසිදායක බවත් වන්දිය ලබා ගැනීමේ වැඩි ඉඩකඩක් පවතින බවත් ය.

[ඉතිරිවන පිටුව බලන්න.

අවශ්‍ය වන්නේ ;

1. ඉහත ගනුදෙනුවලට අදාළව 2014.03.31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනයේ උධෘතය
2. ඉහත ගනුදෙනුවලට අදාළව 2014.03.31 දින මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ (ශේෂ පත්‍රය) උධෘතයන්
3. ඉහත ගනුදෙනු කිසිවක් සැලකිල්ලට නොගෙන ගණනය කරන ලද වර්ෂය සඳහා ලාභය රු. 2 100 000 ක් නම්, වර්ෂය සඳහා නිවැරදි ලාභය ගණනය කිරීමේ ප්‍රකාශනයක්

*(ලකුණු 15 යි)*

**3.** නුවර ක්‍රීඩා සමාජයෙහි 2014.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පහත දැක්වේ.

රු. ('000)

| | පිරිවැය | සමුච්චිත ක්‍ෂය | ධාරණ අගය |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| ක්‍රීඩා සහ කාර්යාල උපකරණ | 950 | 180 | 770 |
| ලී බඩු | 600 | 120 | 480 |
| | 1 550 | 300 | 1 250 |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | – | 150 | – |
| හිඟ හිමි සාමාජික මුදල් | – | 125 | – |
| වෙළඳ ණය ගැතියෝ | | 200 | – |
| මුදල් සහ බැංකු | – | 450 | 925 |
| | | | **2 175** |
| **හිමිකම** | | | |
| සමුච්චිත අරමුදල | – | – | 1 150 |
| විලම්භිත ආදායම | – | – | 450 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ ණයගැතියෝ | – | 420 | – |
| ඉදිරියට ලැබූ සාමාජික මුදල් | – | 95 | – |
| උපචිත වියදම | – | 60 | 575 |
| | | | **2 175** |

2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාරාංශ ගත ලැබීම් සහ ගෙවීම් පහත දැක්වේ.

| | රු.('000) | | රු.('000) |
|---|---|---|---|
| **ලැබීම්** | | **ගෙවීම්** | |
| වාර්ෂික සාමාජික මුදල් | 2 250 | ගැනුම් | 950 |
| යාවජීව සාමාජික මුදල් | 400 | ලී බඩු | 800 |
| පරිත්‍යාග | 475 | කුලිය | 240 |
| අත්පිට විකුණුම් | 750 | ණය හිමියන්ට ගෙවීම | 670 |
| ණය ගැතියන්ගෙන් ලැබීම් | 600 | විදුලිය සහ දුරකථන | 440 |
| ක්‍රීඩා තරගවලින් ලද ආදායම | 550 | ක්‍රීඩා තරග සඳහා වියදම | 410 |
| වාර්ෂික ක්‍රීඩා දිනයෙන් ලද ආදායම | 400 | වැටුප් | 650 |
| | | ක්‍රීඩා සංවිධානය කිරීමේ වියදම් | 330 |
| | | සංග්‍රහ වියදම් | 200 |
| | | ක්‍රීඩා උපකරණ | 450 |
| | | වෙනත් වියදම් | 125 |

[පස්වන පිටුව බලන්න.

අතිරේක තොරතුරු ;

(අ) 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී ක්‍රීඩා සමාජය විසින් යාවජීව සාමාජික ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. ලැබුණු වර්ෂයේ සිට වසර 10 ක කාලසීමාවක් තුළ යාවජීව සාමාජික මුදල ආදායම් සහ වියදම් ගිණුමට හඳුනා ගැනීමට තීරණය විය. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා ඇති විලම්භිත ආදායම ඉතිරි යාවජීව සාමාජික මුදල නිරූපණය කරයි.

(ආ) 2014.03.31 දිනට හිඟ හිටි සහ ඉදිරියට ලැබූ සාමාජික මුදල පිළිවෙළින් රු. 230 000 ක් සහ රු. 180 000 ක් විය. තවද, වර්ෂය ආරම්භයේ පැවති හිඟ හිටි සාමාජික මුදලින් රු. 45 000 ක් කපා හැරීමට තීරණය කරන ලදී.

(ඉ) විකුණුම්, ගැණුම්, තොගය, ණයගැතියෝ සහ ණය හිමියෝ ක්‍රීඩා සමාජය විසින් එහි සාමාජිකයින් වෙනුවෙන් පවත්වාගෙන යන ආපන ශාලාවට අදාළ වේ.

(ඊ) 2014.03.31 දිනට තොගය පිරිවැයට රු. 230 000 කට අගය කළ අතර ශුද්ධ උපලබ්ධි අගය රු. 195 000 ක් වේ.

(උ) ජංගම නොවන වත්කම් පිරිවැය මත පහත පරිදි ක්ෂය කරනු ලැබේ.

ක්‍රීඩා සහ කාර්යාල උපකරණ - වර්ෂයට 10%

ලී බඩු - වර්ෂයට 20%

(ඌ) වර්ෂය තුළ ජංගම නොවන වත්කම් මිලදී ගෙන ඇත්තේ පහත දිනයන්හි දී ය.

ක්‍රීඩා සහ කාර්යාල උපකරණ - 2013.07.01

ලී බඩු - 2013.10.01

(එ) 2013.03.31 දිනට උපචිත වියදම තුළ අන්තර් ගත වන්නේ උපචිත කුලියයි. ගොඩනැගිල්ලෙහි මාසික කුලිය රු. 25 000 කි.

(ඒ) ගොඩනැගිලි කුලියෙන් 40% ක් ආපන ශාලාවට අදාළ වේ. තව ද ආපනශාලා සේවකයින්ගේ වේතන රු. 350 000 ක් ගෙවූ වේතන තුළ ඇතුළත් ය.

(ඔ) 2014.03.31 දිනට ණය ගැති සහ ණය හිමි ශේෂ පිළිවෙළින් රු. 375 000 ක් සහ රු. 325 000 ක් විය.

අවශ්‍ය වන්නේ ;

1. 2014.03.31 න් අවසන් වර්ෂය සඳහා ආපන ශාලාවේ ආදායම් ප්‍රකාශය
2. 2014.03.31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ගිණුම
3. 2014.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ශේෂ පත්‍රය)

(ලකුණු 20 යි)

4. (i) සිග්මා ඉදිකිරීම් පොදු සමාගම ඉදිකිරීම් කොන්ත්‍රාත්තු භාර ගන්නා ආයතනයකි. පහත තොරතුරු 2012.09.01 දින සමාගම භාර ගන්නා ලද ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවකට අදාළ වේ.

| | රු. ('000) |
|---|---|
| එකඟ වූ මුළු කොන්ත්‍රාත්තු ආදායම ...................... | 2 500 |
| මුළු ඇස්තමේන්තුගත පිරිවැය ...................... | 1 800 |
| **2013.03.31** දිනට | |
| ඒ දක්වා දරන ලද මුළු පිරිවැය ...................... | 850 |
| සහතික කරන ලද වැඩ වටිනාකම ...................... | 1 000 |
| ලැබූ මුළු ප්‍රගති ගෙවීම් ...................... | 600 |
| **2014.03.31** දිනට | |
| ඒ දක්වා දරන ලද මුළු පිරිවැය ...................... | 1 950 |
| සහතික කරන ලද වැඩ වටිනාකම ...................... | 2 240 |
| ලැබූ මුළු ප්‍රගති ගෙවීම් ...................... | 1 750 |

නිර්ණායකයන්ගේ (specification) සිදුවූ වෙනසක් නිසා 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී මුළු කොන්ත්‍රාත්තු පිරිවැය සහ කොන්ත්‍රාත්තු ආදායම පිළිවෙළින් රු. 200 000 කින් සහ රු. 300 000 කින් ඉහළ ගියේය.

අවශ්‍ය වන්නේ ;

1. 2013.03.31 න් සහ 2014.03.31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශන උධෘතයන්
2. 2013.03.31 දිනට සහ 2014.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන උධෘතයන්

(ලකුණු 08 යි)

[හයවන පිටුව බලන්න.

(ii) ඉසුරුසිරි සමාගම ප්‍රධාන කාර්යාලය කොළඹ සහ ශාඛාව මහනුවර ක්‍රියාත්මක වේ. 2014.03.31 දිනට පහත ශේෂයන් උපුටාගෙන ඇත.

| | ප්‍රධාන කාර්යාලය | | ශාඛාව | |
|---|---|---|---|---|
| | හර (රු.) | බැර (රු.) | හර (රු.) | බැර (රු.) |
| ආරම්භක තොගය - පිරිවැය | 100 000 | – | – | – |
| - ඉන්වොයිස් මිල | – | – | 72 000 | – |
| 2013.04.01 දිනට උපලබ්ධි නොවූ ලාභ සඳහා වෙන් කිරීම් | – | 14 400 | – | – |
| ගැණුම් | 1 960 000 | – | – | – |
| ශාඛාවට යැවූ භාණ්ඩ | – | 860 000 | – | – |
| ප්‍රධාන කාර්යාලයෙන් ලැබූ භාණ්ඩ | – | – | 800 000 | – |
| විකුණුම් | – | 1 940 000 | – | 1 232 000 |
| වෙනත් ආදායම් | – | 128 000 | – | 72 000 |
| බෙදා හැරීමේ පිරිවැය | 75 500 | – | 89 100 | – |
| පරිපාලන වියදම | 45 500 | – | 55 200 | – |
| මූල්‍ය වියදම | 62 000 | – | 32 000 | – |

අතිරේක තොරතුරු ;

(අ) ප්‍රධාන කාර්යාලය ශාඛාවට භාණ්ඩ ඉන්වොයිස් කරනු ලබන්නේ පිරිවැයට 25% ක ලාභ ආන්තියක් එකතු කළ ඉන්වොයිසි මිලට ය.

(ආ) 2014.03.31 දිනට තොගය

ප්‍රධාන කාර්යාලය - පිරිවැයට රු. 120 000

ශාඛාව - ඉන්වොයිසි මිලට රු. 48 000

අවශ්‍ය වන්නේ ;

තීරු ක්‍රමයට 2014.03.31 න් අවසන් වර්ෂය සඳහා ප්‍රධාන කාර්යාලයේ, ශාඛාවේ සහ සමාගමේ ආදායම් ප්‍රකාශනයන් *(ලකුණු 07 යි)*

*(මුළු ලකුණු 15 යි)*

**5.** ඇඟලුම් නිෂ්පාදනය කර අලෙවි කරනු ලබන මහානාම ට්‍රේඩර්ස් හි 2014.03.31 දිනට පහත ශේෂයන් උපුටා ගන්නා ලදී.

| | හර රු. ('000) | බැර රු. ('000) |
|---|---|---|
| යන්ත්‍ර - පිරිවැය / සමුච්චිත ක්ෂය | 1 200 | 300 |
| ගොඩනැගිලි - පිරිවැය / සමුච්චිත ක්ෂය | 800 | 200 |
| මෝටර් රථ - පිරිවැය / සමුච්චිත ක්ෂය | 750 | 150 |
| 2013.04.01 දිනට තොගය | | |
| - අමුද්‍රව්‍ය | 110 | – |
| - නොනිමි වැඩ | 72 | – |
| - නිමි භාණ්ඩ | 224 | – |
| - ඇසුරුම් ද්‍රව්‍ය | 45 | – |
| අමුද්‍රව්‍ය මිලදී ගැනුම් | 975 | – |
| නිමි භාණ්ඩ ගැනුම් | 165 | – |
| ඇසුරුම් ද්‍රව්‍ය ගැනුම් | 210 | – |
| අමුද්‍රව්‍ය ගෙන ඒමේ කුලි | 44 | – |
| විකුණුම් | – | 3 315 |
| වැටුප් සහ වේතන | 450 | – |
| විදුලිය | 180 | – |
| කුලිය | 90 | – |

[හත්වන පිටුව බලන්න.

**අතිරේක තොරතුරු ;**

(අ) 2014.03.31 දිනට තොගය රු.

| | |
|---|---|
| අමුද්‍රව්‍ය | 166 000 |
| නොනිමි වැඩ | 88 000 |
| ඇසුරුම් ද්‍රව්‍ය | 33 000 |
| නිමි භාණ්ඩ | 210 000 |

(ආ) නොනිමි වැඩ ප්‍රාථමික පිරිවැයට අගය කරනු ලැබේ.

(ඉ) වැටුප් සහ වේතනවල සංයුතිය පහත පරිදි වේ.

| | |
|---|---|
| කර්මාන්තශාලා - සෘජු | 30% |
| කර්මාන්තශාලා - වක්‍ර | 30% |
| බෙදා හැරීම් | 40% |

(ඊ) විදුලිය 30% ක් සහ කුලිය 40% ක් කර්මාන්ත ශාලාව සඳහා අදාළ වේ.

(උ) ඇසුරුම් කිරීම භාණ්ඩ අලෙවි කිරීමට පෙර අලෙවි අංශය විසින් සිදු කරනු ලබයි.

(ඌ) දේපල, පිරියත සහ උපකරණ හීන වන ශේෂ ක්‍රමයට පහත පරිදි ක්ෂය කරනු ලැබේ. ප්‍රවර්ථන වර්ෂය සඳහා ක්ෂය ගණනය කර නැත.

| | |
|---|---|
| ගොඩනැගිලි | 12% |
| මෝටර් රථ | 10% |
| යන්ත්‍ර | 20% |

(එ) කර්මාන්තශාලා ගොඩනැගිල්ලෙහි ධාරණ අගය රු. 200 000 කි.

**අවශ්‍ය වන්නේ ;**

2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන ගිණුම

*(ලකුණු 10 යි)*

* * *

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ සීමිත / විවෘත තරඟ විභාගය – 2014

## (03) පිරිවැය සහ කළමනාකරණ ගණකාධිකරණය

පැ තුනයි

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

1. ලංකා රසායන ද්‍රව්‍ය නිෂ්පාදන සමාගම විසින් ක්‍රමානුගත ක්‍රියාවලි දෙකක් හරහා රසායනික ද්‍රව්‍ය යැවීම තුළින් බද්ධ නිෂ්පාදන තුනක් නිෂ්පාදනය කරනු ලබයි. පළමු පෙරසැරියෙන් ලැබෙන නිමැවුම දෙවන පෙරසැරියට මාරු කරනු ලබන අතර එයින් නිෂ්පාදනය කරනු ලබන බද්ධ නිෂ්පාදන තුන වහාම විකුණනු ලැබේ. 2014 අප්‍රේල් මාසයේ පෙරසැරිවලට අදාළ දත්ත පහත දැක්වේ.

| | පෙරසැරිය 1<br>රු. | පෙරසැරිය 2<br>රු. |
|---|---|---|
| සෘජු ද්‍රව්‍ය ........................................<br>(කි.ග්‍රෑ. 1 ක් රු. 4 බැගින් කි.ග්‍රෑ. 2 500 ක්) | 10 000 | – |
| සෘජු ශ්‍රමය........................................ | 6 250 | 6 900 |
| පොදු කාර්ය ........................................ | 4 500 | 6 900 |
| සාමාන්‍ය අලාභ ........................................ | ඒකකයකට 10% බැගින් | නැත |
| අලාභයෙහි සුන්බුන් වටිනාකම .................. | කි.ග්‍රෑ. 1 ට රු. 2 | – |
| නිමැවුම ........................................ | කි.ග්‍රෑ. 2 300 | බද්ධ නිෂ්පාදන<br>A කි.ග්‍රෑ. 900<br>B කි.ග්‍රෑ. 800<br>C කි.ග්‍රෑ. 600 |

පෙරසැරි දෙකෙන් කිසිවක ආරම්භක හෝ අවසාන තොග නොමැති අතර පෙරසැරිය 2 ට අදාළ නිමැවුම්වල විකුණුම් මිල ගණන් පහත දැක්වේ.

බද්ධ නිෂ්පාදන A කි.ග්‍රෑ. එකක් රු. 24 බැගින්
බද්ධ නිෂ්පාදන B කි.ග්‍රෑ. එකක් රු. 18 බැගින්
බද්ධ නිෂ්පාදන C කි.ග්‍රෑ. එකක් රු. 12 බැගින්

**ඔබ විසින් ;**

(i) අසාමාන්‍ය ලාභ හෝ පාඩු ගිණුම් සමග පෙරසැරිය 1 ගිණුම පිළියෙල කරන්න.

(ii) පහත පරිදි පෙරසැරිය 2 ගිණුමේ මුළු පිරිවැය විභාජනය කරමින් එක් එක් බද්ධ නිෂ්පාදන සඳහා ආරෝපණය කළ හැකි ලාභය ගණනය කරන්න.

(අ) නිමැවුමේ බර ප්‍රමාණ අනුව
(ආ) නිෂ්පාදනයේ වෙළඳපොළ වටිනාකම අනුව

*(ලකුණු 25 යි)*

[දෙවන පිටුව බලන්න.

**2.** බහු නිෂ්පාදන සමාගමක් සිය නිෂ්පාදන අතරට අළුත් භාණ්ඩයක් හඳුන්වාදීම සඳහා සැලසුම් කරයි. 2014 ජුලි මාසයේදී නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට නියමිත අතර ඊට අදාළ පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කෙරේ.

(i) වාර්ෂික සාමාන්‍ය නිෂ්පාදනය ඒකක 50 000 ක් ලෙස පදනම් කරගෙන ඒකකයක ප්‍රමිත නිෂ්පාදන පිරිවැය පහත සඳහන් පරිදි ගණනය කර ඇත.

| | (රු.) |
|---|---|
| සෘජු ද්‍රව්‍ය | 20 |
| සෘජු ශ්‍රමය | 10 |
| විචල්‍ය පොදුකාර්ය | 20 |
| ස්ථාවර පොදුකාර්ය | 5 |
| මූල්‍ය පිරිවැය | **55** |

ස්ථාවර පොදුකාර්ය වර්ෂය පුරා සමානව වැයවේ යැයි අපේක්ෂා කෙරේ. යන්ත්‍ර උපකරණ හා කර්මාන්ත ශාලා ගොඩනැගිලි ක්ෂයවීම් සඳහා වූ රු. 70 000 ක වියදමක් ද ස්ථාවර පොදුකාර්යවලට ඇතුළත් ය.

(ii) සමාගම 2014 අවසාන මාස හය සඳහා විකුණුම් පහත සඳහන් පරිදි යැයි ඇස්තමේන්තු කර ඇත.

| මාසය | ඒකක ගණන | මිල (රු.) |
|---|---|---|
| ජුලි | 1 000 | 80 |
| අගෝස්තු | 3 000 | 70 |
| සැප්තැම්බර් | 3 400 | 80 |
| ඔක්තෝබර් | 4 000 | 70 |
| නොවැම්බර් | 4 000 | 80 |
| දෙසැම්බර් හා ඊට පසු | 3 500 | 80 |

විකුණුම්වලින් 60% ක් ණයට වන අතර ඉතිරිය අත්පිට විකුණනු ලැබේ. ණයට විකුණුම්වලින් 50% ක් භාණ්ඩ විකුණනු ලබන මාසයේ දී ද, ඉතිරිය ඊට පසු මාසයේ දී ද ලැබේ.

(iii) විකුණුම් වියදම් දළ විකුණුම්වලින් 5% ක් ලෙස තක්සේරු කර ඇති අතර ඒවා වියදම් දැරූ මාසයට පසු මාසයේදී ගෙවනු ලැබේ.

(iv) සමාගමේ නිමි තොග ප්‍රතිපත්තිය වනුයේ 2014 ජුලි සිට එක් එක් මාසයේ අලෙවිය විකුණුම් ප්‍රමාණයෙන් 50% ක් ඊට පෙර මාසයේ අවසාන දිනයේදී තබා ගැනීමය. නොනිමි වැඩ තැබීමට ඉඩ දෙනු නොලැබේ.

(v) සෘජු ද්‍රව්‍ය සම්බන්ධව සමාගමේ ප්‍රතිපත්තිය නම් සෑම මාසයක් අගදීම ඊළඟ මාසයේ නිෂ්පාදන අවශ්‍යතාවයන්ගෙන් අවම වශයෙන් 50% කට සමාන අමුද්‍රව්‍ය තොගයක් තබා ගැනීම ය. ද්‍රව්‍ය සඳහා මුදල් ගෙවනුයේ මිලට ගත් මාසයට පසු මාසයේ දී ය.

(vi) මාසය සඳහා වූ සෘජු වේතන ගෙවනු ලබන්නේ ඒවා දරන ලද මාසයේ දී ය.

(vii) විචල්‍ය පොදුකාර්ය වියදම්වලින් 25% ක් එවා දරන මාසයේ දී ද, ඉතිරිය පසු මාසයේ දී ද ගෙවනු ලැබේ.

(viii) ස්ථාවර පිරිවැය ඒවා දැරූ මාසයේදීම ගෙවනු ලැබේ.

ඔබ විසින් ;

(අ) ඉහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මාස හය සඳහා මාසික මුදල් අයවැය ලේඛනයක් පිළියෙල කරන්න.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය හා මුළු ණයහිමි ශේෂය ගණනය කරන්න.

*(ලකුණු 25 යි)*

**3.** තනි භාණ්ඩයක් නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලාවක වර්ෂයක කාල පරිච්ඡේදය සඳහා නිෂ්පාදන අයවැය ලේඛනයේ සාරාංශයක් පහත දැක්වේ.

නිෂ්පාදන ප්‍රමාණය : ඒකක 160 000

නිෂ්පාදන පිරිවැය :-

| | | |
|---|---|---|
| සෘජු ද්‍රව්‍ය | : | කි.ග්‍රෑ. එකකට රු. 8.20 බැගින් කි.ග්‍රෑ. 224 000 |
| සෘජු ශ්‍රමය | : | පැයකට රු. 9.00 බැගින් පැය 144 000 |
| විචල්‍ය පොදුකාර්ය | : | රු. 633 000 |
| ස්ථාවර පොදුකාර්ය | : | රු. 2 016 000 |

කලින් තීරණය කළ සෘජු ශ්‍රම පැය අනුපාතයට විචල්‍ය පොදුකාර්ය අවශෝෂණය කරනු ලබයි. කලින් තීරණය කරන ලද නිමැවුමේ ඒකකයක අනුපාතයට ස්ථාවර පොදුකාර්ය අවශෝෂණය කෙරේ.

එක් වර්ෂයක කාලය තුළදී සත්‍ය නිෂ්පාදනය ඒකක 143 000 ක් වූ අතර, එයට පහත සඳහන් පිරිවැය දරන ලදී.

| | | |
|---|---|---|
| සෘජු ද්‍රව්‍ය | : | පිරිවැය රු. 1 627 600 ක් වූ කි.ග්‍රෑ. 203 450 |
| සෘජු ශ්‍රමය | : | පිරිවැය රු. 1 183 000 ක් වූ පැය 130 000 |
| විචල්‍ය පොදුකාර්ය | : | රු. 578 000 |
| ස්ථාවර පොදුකාර්ය | : | රු. 2 001 000 |

පහත සඳහන් දෑ ගණනය කරන්න.

(i) ඒකකයක ප්‍රමිත පිරිවැය
(ii) ද්‍රව්‍ය මිල විචලනය
(iii) ද්‍රව්‍ය භාවිත විචලනය
(iv) සෘජු ශ්‍රම අනුපාත විචලනය
(v) ශ්‍රම කාර්යක්ෂමතා විචලනය
(vi) විචල්‍ය පොදුකාර්ය වියදම් විචලනය
(vii) විචල්‍ය පොදුකාර්ය කාර්යක්ෂමතා විචලනය
(viii) ස්ථාවර පොදුකාර්ය වියදම් විචලනය
(ix) ස්ථාවර පොදුකාර්ය පරිමා විචලනය
(x) මුළු පිරිවැය විචලනය

*(ලකුණු 26 යි)*

**4.** XY සමාගමට අදාළව පහත සඳහන් දත්ත ඔබ වෙත ඉදිරිපත් කෙරේ.

| වර්ෂය | විකුණුම් රු. | ලාභය රු. |
|---|---|---|
| 2013 | 360 000 | 24 000 |
| 2014 | 420 000 | 29 000 |

ඔබ විසින් පහත සඳහන් දෑ ගණනය කරන්න.

(i) ලාභ පරිමා අනුපාතය (P/V ratio)
(ii) සමච්ඡේදන ලක්ෂ්‍යය (Break - event point)
(iii) විකුණුම් රු. 540 000 වන විට ලාභය
(iv) රු. 36 000 ක ලාභයක් උපයා ගැනීමට අවශ්‍ය විකුණුම්
(v) 2014 වර්ෂයේ ආරක්ෂිත ආන්තිකය (Margin of safety)

*(ලකුණු 13 යි)*

[ගතරවන පිටුව බලන්න.

**5.** ප්ලාස්ටික් නිෂ්පාදන සමාගමක් විසින් විශේෂ නිපැයුමක් වූ 'A' නිෂ්පාදනය කරනු ලබයි. 2013 වර්ෂය සඳහා පහත සඳහන් තොරතුරු රැස්කර ගන්නා ලදී.

| | | |
|---|---|---|
| 'A' සඳහා මාසික ඉල්ලුම | : | ඒකක 2 000 |
| ඇණවුම් කිරීමේ පිරිවැය | : | රු. 100 |
| ඒකකයක් ගබඩාවේ තබා ගැනීමට යන වාර්ෂික පිරිවැය | : | රු. 26 |
| සාමාන්‍ය පරිභෝජනය (Usage) | : | සතියකට ඒකක 100 |
| අවම පරිභෝජනය | : | සතියකට ඒකක 40 |
| උපරිම පරිභෝජනය | : | සතියකට ඒකක 150 |
| නැවත ඇණවුම් කිරීමේ කාලය | : | සති 4 සිට සති 6 දක්වා |

ඉහත තොරතුරු උපයෝගි කර ගනිමින් පහත ඒවා ගණනය කරන්න.

(i) නැවත ඇණවුම් ප්‍රමාණය (ROQ)

(ii) නැවත ඇණවුම් මට්ටම (ROL)

(iii) අවම තොග මට්ටම

(iv) උපරිම තොග මට්ටම

(v) සාමාන්‍ය තොග මට්ටම

*(ලකුණු 11 යි)*

* * *

7018

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
*All Rights Reserved]*

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ
සීමිත / විවෘත තරග විභාගය - 2014

**(05) විගණනය හා විමර්ශනය**

පැ තුනයි

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

**1.** (i) අභ්‍යන්තර විගණනය (Internal Audit) හා අභ්‍යන්තර පරීක්ෂාව (Internal Check) යනු කුමක්දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

(ii) බාහිර විගණක විසින් ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි, අභ්‍යන්තර විගණක විසින් ඉටු කරනු ලබන කාර්යයන් පහක් සඳහන් කරන්න. *(ලකුණු 10 යි)*

**2.** 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගණකාධිකරණ හා විගණන ප්‍රමිති පනත යටතේ ප්‍රකාශයට පත්කර ඇති විගණන ප්‍රමිතිවල දැක්වෙන පහත සඳහන් කරුණු පැහැදිලි කරන්න.

(i) ප්‍රමාණාත්මකභාවය හා විගණන අවදානම (Materiality and Audit Risk) අතර ඇති සම්බන්ධය *(ලකුණු 06 යි)*

(ii) ගිණුම්කරණයට අදාළ අභ්‍යන්තර පාලනවලින් අපේක්ෂිත අරමුණු (Internal Controls Related to Accounts) *(ලකුණු 08 යි)*

(iii) අභ්‍යන්තර පාලනවල ආවේණික සීමා (Inherent Limitations in Internal Controls) *(ලකුණු 06 යි)*

**3.** (i) රාජ්‍ය ආයතනවල විගණනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති පරිදි විගණකාධිපතිගේ කාර්යභාරය සඳහන් කරන්න. *(ලකුණු 10 යි)*

(ii) එම කාර්යභාරය ඉටුකිරීම සඳහා ව්‍යවස්ථාවෙන් විගණකාධිපතිතුමාට ලබා දී ඇති අයිතිවාසිකම් කවරේ ද? *(ලකුණු 10 යි)*

**4.** විගණනය සඳහා ඔබ වෙත ලැබී ඇති වර්ෂ අවසාන ගිණුම් ප්‍රකාශවල දැක්වෙන පහත සඳහන් අයිතමයන් ඔබ සන්නිරීක්ෂණය / සත්‍යාපනය කරන්නේ කෙසේ ද?

(i) ස්ථාවර වත්කම් සඳහා ගණනය කර ඇති ක්ෂය ප්‍රතිපාදන
(ii) සේවක වැටුප්
(iii) බැංකු අයිරාව
(iv) අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය
(v) දීර්ඝ කාලීන ආයෝජන

*(ලකුණු 20 යි)*

**5.** කෙටි සටහන් ලියන්න.

(i) විශ්ලේෂණාත්මක ක්‍රියාපටිපාටි (Analytical Procedures)
(ii) 1971 අංක 38 දරන මුදල් පනත (Financial Act No.38 of 1971)
(iii) අභ්‍යන්තර පාලන ප්‍රශ්නාවලිය (Internal Control Questionnaire)
(iv) කාර්ය සාධන විගණනය (Performance Audit)
(v) විගණනය හා විමර්ශනය (Audit and Investigation)

*(ලකුණු 20 යි)*

* * *